**තලාව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

**01.** **මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ** මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට අප්‍රේල් මස දක්වා එකතුව රු.2,401,498 ක් වූ උසාවි දඩ ආදායම් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම් හා ලැබිය යුතු උසාවි දඩ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය වෙනුවෙන් ගෙවන ලද රු.1,013,806 ක පොළිය වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වියදම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) තලාව පොදු වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ පිරිවැය එකතු කළ අගය මත බදු සමග රු.31,620,454 ක් වුවත් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ එම වටිනාකම රු.19,250,868 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ශේෂපත්‍රයේ ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීම් ගිණුම රු.12,369,586 බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා වැය කරන ලද රු.1,979,927 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරන ලද ව්‍යාපෘති 04 ක ණයගැති හා ණයහිමි වටිනාකම් නිවැරදි ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් කර්මාන්ත ණයගැතියන් රු.961,773 කින් වැඩියෙන් හා කර්මාන්ත ණයහිමියන් රු.995,734 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 වර්ෂයේ පළාත් මාර්ග සතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ලැබුණු රු.3,760,130 ක් සෞඛ්‍ය වැඩසටහන් සේවා සඳහා ලැබීමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මෙහෙයුම් ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ඉකුත් වර්ෂය අවසානයට ආපසු ගෙවිය යුතු තැන්පත් ගිණුමේ පැවැති රු.2,639,000 ක් විධිමත් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණු හිඟහිටි වරිපනම් වටිනාකම සහ උපලේඛන අනුව ගණනය කරන ලද හිඟහිටි වරිපනම් වටිනාකම් අතර රු. 128,014 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන බැරකම් යටතේ දක්වා තිබුණු දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය වටිනාකම සහ ඊට අදාල ලේඛන හා වාර්තා අනුව දැක්වෙන ණය වටිනාකම් අතර රු. 1,237,749 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ටෙන්ඩර් ඇප තැන්පත්, ලේඛනය අනුව ශේෂය රු.2,200,726 වුවත් ටෙන්ඩර් ඇප තැන්පත් ලෙජරයේ එම ශේෂය රු.2,149,719 ක් ලෙස දැක්වීම නිසා රු.51,007 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

-------------------

වර්ෂ ගණනාවක සිට පැවත එන රු.36,026 ක ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.125,629,026 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

-----------------

1.3.5.1 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

-------------------------------------------------------------------

නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත<br>I. 177 වගන්තිය | සභාවේ සේවය කරන තවකාලික අනියම් සේවකයන්ගේ සේවය අවසන් කල විට ඔවුන්ට පාරිතෝෂිත ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. |

II. 182 වගන්තිය

ප්‍රාදේශීය සභාවට අයවීමට තිබූ එකතුව රු.384,700 ක කර්මාන්ත හා ව්‍යාපාර බදු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.

1.3.5.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත ප්‍රකාරව සේවා සැපයීමෙන් අයකරගත් ජාතිය ගොඩනැගීමේ බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අයකරගෙන තිබූ එකතුව රු.262,273 ක් වූ බදු මුදල් අතරදවා ගෙන තිබුණි.

(ආ) 2006 අංක 12 දරන විශේෂ මුද්දර ගාස්තු පනත ප්‍රකාරව ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අයකර ගන්නා ලද එකතුව රු.143,125 ක් වූ මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,371,569 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.3,849,605 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් වර්ගය | 2017ජනවාරි 01දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017.01.01 හිඟය වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017බිල්කළ මුදලින් වටිනාකම | 2017දෙසැම්බර් 31දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,387,281 | 2,080,444 | 5,387,281 | 1,599,201 | 5,835,685 |
| උසාවි දඩ | 8,577,140 | 7,801,067 | 8,577,140 | 6,000,000 | 10,378,206 |
| මුද්දර ගාස්තු | 222,000 | - | - | - | 222,000 |
| බලපත්‍ර ගාස්තු | 472,500 | 518,350 | 142,550 | 87,490 | - |
| ව්‍යාපාර බදු | 3,200,000 | 4,789,774 | 523,200 | 561,600 | - |
| කඩ කුලී | 1,182,640 | 1,204,560 | 3,047,495 | 226,975 | 583,280 |
| එකතුව | 19,041,561 | 16,394,195 | 17,677,666 | 8,475,266 | 17,019,171 |

2.2.2 වරිපනම්

-----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් ශේෂය රු. 15,503,033 ක් වූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව එම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට අප්‍රේල් මස දක්වා උසාවි දඩ ආදායම හඳුනාගෙන නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට රු.10,378,207 ක් වූ උසාවි දඩ හා රු.3,502,840 ක් වූ මුද්දර ගාස්තු පළාත් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

3.1 කාර්යසාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණය, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

---------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය හි සඳහන් ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් 2016 මාර්තු 30 දිනැති අංක 1960/35 දරන අති විශේෂ පළාත් සභා ගැසට් පත්‍රය මගින් පලකරන ලද කාරණා 10 කට අදාල පොදු අතුරු ව්‍යවස්ථාව සභාව විසින් අනුගමනය කර ඇති බව සඳහන් කර තිබුණි. එහෙත් මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුගමනය කරන බව ගැසට් පත්‍රයක පළ කිරීමෙන් එය නීත්‍යානුකූල කරගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්

--------------------------------

සමාලෝචිත වර්ෂය තුළ රු.7,381,000 ක ප්‍රතිපාදන මත ඉටු කිරීමට යෝජිත ව්‍යාපෘති 37 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------

කාබනික පොහොර නිෂ්පාදනය හා අලෙවිය සඳහා වැඩ පිළිවෙලක් 2017 වර්ෂය තුළද ක්‍රියාවට නංවා නොතිබුණි. පිළිසරු ව්‍යාපෘතිය සඳහා කසළ වර්ග කිරීමකින් තොරව රැගෙන ඒම නිසා කසළ වෙන්කර ගැනීම සඳහා සභාවට අමතර කාලයක් හා පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඈ). තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ ව සභාව දැනුවත් වී තිබුණ නමුත් එම අරමුණු ඉටුකර ගැනීම සඳහා දීර්ඝ කාලීන සැලසුම් සකස් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
--------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් ආදායම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව තත්‍ය ආදායමේ සියයට 50 සිට සියයට 267 දක්වා පරාසයකින් යුත් විචලනයන් වී තිබුණු අතර වියදම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත වියදමට සාපේක්ෂව තත්‍ය වියදම අතර සියයට 41 සිට සියයට 97 දක්වා වූ පරාසයකින් යුක්ත විචලනයක් දක්නට ලැබුණු නිසා අයවැය ලේඛණයක් ඵලදායී කළමනාකරණ පාලනයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර තිබූ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන
-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම. |
| (ආ) | වත්කම්/දේපල | ලේඛනගත නොකිරීම. |
| (ඇ) | සේවක කළමනාකරණය | i. පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබීම.<br>ii. නියත තනතුරට හිමි රාජකාරි වලට පරිබාහිර රාජකාරිවල යෙදවීම. |
| (ඈ) | ණයගැති/ණයහිමි | i. කාල විශ්ලේෂණය පිළියෙල නොකිරීම.<br>ii. ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම. |